# කතෝලික ධර්මය

## 2 ශ්‍රේණිය

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව



සියලු ම පෙළපොත් ඉලෙක්ට්‍රොනික් මාධ්‍යයෙන් ලබා ගැනීමට
www.edupub.gov.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

පළමු වන මුද්‍රණය 2016
දෙවන මුද්‍රණය 2017
තුන්වන මුද්‍රණය 2018
හතරවන මුද්‍රණය 2019
පස්වන මුද්‍රණය 2020

සියලුම හිමිකම් ඇවිරිණි.

ISBN 978-955-25-0225-5

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
පානළුව, පාදුක්ක පිහිටි රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ
මුද්‍රණය කරවා ප්‍රකාශයට පත් කරන ලදි.

Published by: Educational Publications Department
Printed by: State Printing Corporation, Panaluwa, Padukka.

# ශ්‍රී ලංකා ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
සුන්දර සිරිබරිනී, සුරැඳි අති සෝබමාන ලංකා
ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා
අපහට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා
පිළිගනු මැන අප භක්ති පූජා
නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
ඔබ වේ අප විද්‍යා  ඔබ ම ය අප සත්‍යා
ඔබ වේ අප ශක්ති  අප හද තුළ භක්ති
ඔබ අප ආලෝකේ  අපගේ අනුප්‍රාණේ
ඔබ අප ජීවන වේ  අප මුක්තිය ඔබ වේ
නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා
ඥාන වීර්ය වඩවමින රැගෙන යනු මැන ජය භූමි කරා
එක මවකගෙ දරු කැල බැවිනා
යමු යමු වී නොපමා
ප්‍රේම වඩා සැම භේද දුරැර ද නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

අපි වෙමු එක මවකගෙ දරුවෝ
එක නිවසෙහි වෙසෙනා
එක පාටැති එක රුධිරය වේ
අප කය තුළ දුවනා

එබැවිනි අපි වෙමු සොයුරු සොයුරියෝ
එක ලෙස එහි වැඩෙනා
ජීවත් වන අප මෙම නිවසේ
සොඳින සිටිය යුතු වේ

සැමට ම මෙත් කරුණා ගුණෙනී
වෙළී සමගි දමනී
රන් මිණි මුතු නොව එය ම ය සැපතා
කිසි කල නොම දිරනා

**ආනන්ද සමරකෝන්**

# පෙරවදන

මනුගුණදම් සුරකින්නට නිති කැපවුණු කුසලතා පිරි මනුෂ්‍ය වර්ගයාට මේ ලෝකය වඩාත් සොඳුරු බිමක් බවට පත් කළ හැකි ය. ඒ සඳහා රටක අධ්‍යාපනය නිරතුරුවම බලසම්පන්න කරගතයුතු වන්නේ අනාගත වැඩලොව පිළිබඳව ද මනා අවදියෙන් සිටිමිනි. දිනෙන් දින විශ්ව ගම්මානය වෙත එක්වන සාරවත් නව දැනුම අපේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සමඟ මුසුකර ගැනීම අනිවාර්යයෙන් සිදුවිය යුතු අතරම අපගේ යහගුණදම් ද ඒ හා ඒකාත්මික කරගන්නට අමතක නොකළ යුතු ය. මෙම සාධනීය ගුණාංග රැකගනිමින් වඩාත් යහපත් සිසු පරපුරක් නිර්මාණය කිරීමේ උත්කෘෂ්ට මෙහෙවරට අවැසි ගුණාත්මක ඉගෙනුම් ආධාරක සම්පාදනය කිරීම අප දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ පරමාර්ථය බව අවධාරණය කරමි.

නේක විසිතුරු සිත්තම් හා අකුරුවලින් සපිරි මේ පෙළපොත් අනාගත ලොවට මඟ එළි දල්වන ප්‍රදීපස්තම්භ බඳු ය. ඔබ පාසල් බිමෙන් සමුගත් දිනක වුව, තුටින් සිහි කළ හැකි මිහිරි මතක, මේ පාඩම් පොත් පිටු අතර රැඳී තිබෙනු නිසැක ය. ගුරු තරුවල නොමඳ ආලෝකය ලබා ගනිමින් ඔබ මේ දැනුම හා වින්දනය කැටිකළ අනගි ත්‍යාගයෙන් නිසි පල නෙළා ගත යුත්තේ තව තවත් දැනුම් අවකාශ වෙත යුහුසුලුව පියමනිමිනි. රජය පෙළපොත් වෙනුවෙන් වැය කළ අප්‍රමාණ වූ ධනස්කන්ධයට අමිල අගයක් ලබා දිය හැක්කේ පාසල් සිසු දරු දැරියන් වූ ඔබට පමණි. දිවිය වෙත හඹා එන අනේක බාධක දිරියෙන් ජයගෙන, හෙට ලොව සුපුෂ්පිත කරවන්නට දැයේ දරුදැරියන්ට හැකිවේවායි අප්‍රමාණ ස්නේහයෙන් ආශීර්වාද කරන්නෙමි.

පෙළපොත් සම්පාදන ක්‍රියාවලිය වෙනුවෙන් මනා කැපවීමකින් සම්පත්දායකත්වය සැපයූ ලේඛක, සංස්කාරක හා ඇගයුම් මණ්ඩල සාමාජික පිරිවරටත් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ සැමටත් මාගේ හදපිරි ස්තුතිය පිරිනමමි.

**පී. එන්. අයිලප්පෙරුම**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල
2020.06.26

**නියාමනය හා අධීක්ෂණය**

පී. එන්. අයිලප්පෙරුම - අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**මෙහෙයවීම**

ඩබ්ලිව්. ඒ. නිර්මලා පියසීලි - අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් (සංවර්ධන)
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**සම්බන්ධීකරණය**

ආර්.ඩී. විජේවික්‍රම - නියෝජ්‍ය කොමසාරිස්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**සහාය සම්බන්ධීකරණය**

එස්.ජී.ඩී.එන්.එල්. සමරකෝන් - සහකාර කොමසාරිස්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**අනුශාසකත්වය**

අතිඋතුම් දේව ධර්මාචාර්ය ඔස්වල්ඩ් ගෝමිස් අගරදගුරු හිමිපාණෝ (විශ්‍රාමික)

අතිඋතුම් දේව ධර්මාචාර්ය මැක්ස්වල් සිල්වා රදගුරු හිමිපාණෝ

අතිගරු පියල් ජානක ප්‍රනාන්දු පියතුමා

**සංස්කාරක මණ්ඩලය**

පී.ඩී.එෆ්. ෆිලීෂියා අයිරින් - ගුරු උපදේශිකා,
කලාප අධ්‍යාපන කාර්යාලය, වත්තල

ආර්.ටී.සී.එෆ්. කුලතිලක - ගුරු වෘත්තිය,
සියලු සාන්තුවරයන්ගේ බාලිකා මහා විද්‍යාලය
බොරැල්ල.

**ලේඛක මණ්ඩලය**

නිර්මලා රත්නායක - ගුරු වෘත්තිය, ශාන්ත පීතර විද්‍යාලය,
කොළඹ 4.

සී. අයිරාංගනි රුද්‍රිගු - ගුරු වෘත්තිය, ශාන්ත ලූසියා ම.වි.
කොටහේන, කොළඹ 13.

ටී.ජේ. පෝල් ඇන්ටනි - විශ්‍රාමික විද්‍යාලපති

**භාෂා සංස්කාරක**

රංජිත් ඉලුප්පිටිය - නියෝජ්‍ය කොමසාරිස්,
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**චිත්‍ර සහ පිටකවරය**

ඩී. ප්‍රසාද් නිශාන්ත පීරිස් - ගුරු වෘත්තිය, ශාන්ත පීතර විද්‍යාලය,
කොළඹ 04.

**පරිගණක අක්ෂර සංයෝජනය හා පිටු සැලසුම්කරණය**

එල්. ඒ. සඳුනි නිලංකා පත්මසිරි - පරිගණක අංශය,
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

# පටුන


පිටු අංකය


1. නව වසරට දේව ආශීර්වාදය 1
2. මහෝත්තම දෙවි පියාණන් වහන්සේගේ ආදර මැවිල්ල 3
3. එකමුතුකමයි ආදරයයි 5
4. උතුම් දේව මැවිල්ල 7
5. මරණය ජයගත් ජේසුස් වහන්සේ 9
6. කීකරුයි අපි කීකරුයි 11
7. සතුටින් අපි උදවු කරමු 13
8. කිතුනු දරුවා හොඳ ළමයෙකි 15
9. මහෝත්තම දෙවි පියාණන් වහන්සේ නමදිමු 17
10. සාන්ත මරියනි 19
11. එකමුතු පවුල අපේ 21
12. යමු අපි දෙවිඳුන් හමුවට 23
13. සැමගෙ උදවු 25
14. ඔවදන් දෙයි - යහමඟ පෙන්වයි 28
15. ගව ඔරුවේ උපන් බිළිඳු 31
16. පුංචි අපේ හොඳ මිතුරා 33
17. ආදම් සහ ඒව 35
18. කායින් සහ ආබෙල් 37
19. නෝවා සහ ජල ගැල්ම 39
20. ශුද්ධ වූ දොමිනික් සාවියෝ මුනිතුමා 42
21. ශුද්ධ වූ නිකුලස් මුනිතුමා 44

ක්‍රියාකාරකම් 46 - 53

1

# නව වසරට දේව ආශීර්වාදය



අලුත් දිනක් උදා වෙලා. අපට හරි ම සතුටුයි.
අපි අලුත් ඇඳුම් ඇඳලා
අලුත් පොත් අරගෙන ආවා.
අපේ පන්තිය හරි ලස්සනයි.
අපේ ගුරුතුමිය බලා ඉන්නවා
අප ආදරයෙන් පිළිගැනීමට.
අපි ගුරුතුමියට සුබ පතමු.

ආයුබෝවන් ගුරුතුමියනි
ජේසු පිහිටයි!

මේ සැම දේ ම අපට ලබා දුන් ආදර
දෙවි පියාණෙනි, ඔබ වහන්සේට අපි ස්තුති කරමු.
මේ සැම දේ ආරක්ෂා කර
පිරිසිදු ව තබා ගන්නට අපට උදවු කළ මැනව.
ආමෙන්!



පැවරුම

1. අලුත් අවුරුද්දේ ඔබට දෙවි පියාණන් වහන්සේ ලබා දුන් දේවල් දෙකක් නම් කරන්න.

උපදෙස් :. 1 පාඩමට අදාළ ක්‍රියාකාරකම පිටු අංක 46හි ඇත.

# 2

# මහෝත්තම දෙවි පියාණන් වහන්සේගේ ආදර මැවිල්ල




හිරු නැගෙමින් - සඳ දිලෙමින්
තරු සිනාසෙමින්
අහස් කුසේ කුරුලු රංචු
ඉගිළ යති තුටින්
දෙවිඳු ආදරේ ගයමින්
ඉපිලෙති සතුටින්

පලබර මහ ගස්
ගසේ එතුණු වැල්
අහිංසක ව දුව පැන යන
වනයෙ වන සතුන්
සුරකින්නේ මහ බල ඇති
අප පිය දෙවිඳුන්

කෙත් වතු සිඹගෙන හමනා
මඳ සිහිල් සුළං
පොළෝ තලෙන් මතු කර දෙන
සියලු සාරයන්
ලබා දුන්නේ ආදරයෙන්
පිය දෙවි සමිඳුන්

කඳු හෙල් අතරින් ගලනා
රිදී දිය කඳන්
ඇළේ දොළේ පිහිනා යන
දණ්ඩි කොරලියන්
මහ සයුරේ දිවි ගෙවනා
ලොකු පොකිරිස්සන්
ජලය පුරා තුටින් නටන
පුංචි මාළුවන්
පිය දෙවිඳුගෙ මහිමෙ ලොවට
කියන සැටි බලන්



ආදර දෙවි පියාණෙනි, මේ ලස්සන ලෝකය අපට කියා පාන්නේ ඔබ වහන්සේගේ ආදරයයි. එය අපට ආලෝකය පිරිසිදු ජලය ආහාර වැනි බොහෝ දේ ලබා දෙනවා. ඒ නිසා පරිසරය ආදරෙයන් රැකබලා ගෙන අගය කිරීමට පුංචි අපට කියා දුන මැනව. ආමෙන්!



පැවරුම

1. දෙවි පියා මැවූ දේවල් පහක් කොටුවක් තුළ ඇඳ පාට කරන්න.

උපදෙස් :. 2 පාඩමට අදාළ ක්‍රියාකාරකම පිටු අංක 53හි ඇත.

# 3

# එකමුතුකමයි ආදරයයි

ආදරයෙන් කරුණාවෙන්
අප අමතනවා
වරදක් වූ විට පෙන්වා
සමාව දෙනවා
ඔවදන් දීමෙන් අප හට
අකුරු කරවනා
අප ආදර ගුරුතුමියට
ආසිරි වේවා!





සෙල්ලම් කරනට මා හා
එකට එක්වෙලා
වැටුණෝතින් උදවු කරයි
මා සනසාලා
පාසල් වැඩ කරන්නටත්
මට උදවු වෙලා
එකමුතුවෙයි යාළුවෝ සැම
සතුටින් පිරිලා

කරදරයක් වූ විට
නිතර ම දුව එනවා
සුවදුක් විමසා සැම විට
උදවු කරනවා
ආදරයයි කරුණාවයි
අපට ලැබෙනවා
අහල පහළ සැම දෙනා ම
දෙවි රැකදේවා



**මේ සැම දෙනා ම ලබා දුන් මහෝත්තම දෙවි පියාණෙනි, ඔබ වහන්සේට ස්තුතියි. ඔවුන් සැම දෙන ආශීර්වාද කර ආරක්ෂා කළ මැනව. ආමෙන්!**



**පැවරුම**

1. ඔබට ආදරය කරන යහළු යෙහෙළියන්ගේ නම් හතරක් ලියන්න.

**ක්‍රියාකාරකම**

- ★ එක ළඟ එක වගේ ලියා ඇති අකුරු පැන්සල් ඉරකින් කපන්න.
- ★ ඉතිරි වන අකුරුවලින් සෑදෙන වාක්‍යය අභ්‍යාස පොතේ ලියන්න.
- ★ එය හඬ නගා කියවන්න.

ග ග ග ම ග ග ග ම ග ග ග

හ හ ගු හ හ රු හ හ ව හ හ රු හ හ න් හ හ ට

ල ල ල ආ ල ල ල ද ල ල රෙ ල ල ල යි.

# 4

# උතුම් දේව මැවිල්ල

දෙවි පියාණන් වහන්සේගේ උතුම් ම හා වටිනා ම මැවිල්ල මමයි. දෙවිපියාණෝ මට ආදරෙයි. මා දෙවිපියාණන්ට ගොඩක් වටිනවා. දෙවිපියාණන් මට ලබා දුන් ශරීරය මම පිරිසිදුව තබා ගනිමි.



පුංචි පුංචි පුංචි ළමෝ - මුතුවන් පොඩි දසන් විදා
තෙල් ගාලා හිස පීරා - පිරිසිදු ඇඳුමක් ඇඳලා
ඇවිදින විට සිතේවිදෝ - දේව දූතයෙක් කියලා

**ආදර දෙවි පියාණෙනි, මා ඔබ වහන්සේගේ වටිනා දරුවෙක් ලෙස මැවුවාට ස්තුතියි. මගේ ශරීරය ආරක්ෂා කරන හොඳ පුරුදු ඉගෙන ගන්නට මට පිහිට වුව මැනව. ආමෙන්!**



**පැවරුම**

1. ඔබ කැමති යහපත් පුරුදු දෙකක් අභ්‍යාස පොතේ ලියන්න. ඇඳ පාට කරන්න.

**ක්‍රියාකාරකම**

★ පුංචි ඔබට දෙවි පියාණන් වහන්සේ සතුටු කළ හැකි පුරුදු පමණක් තෝරා එම කොටු කහ පාටින් පාට කරන්න.

| | | |
|---|---|---|
| උදේ රෑ දත් මැදීම | නියපොතු හැපීම | නියපොතු කැපීම |
| හිස කෙස් අවුල් වී තිබීම | පිරිසිදු ඇඳුම් ඇඳීම | නෑම |

# 5


# මරණය ජය ගත් ජේසුස් වහන්සේ



අප පාපයෙන් ගලවා ගන්න ජේසුස් වහන්සේ ලෝකයට ආවා. ඔවුන් වහන්සේ තම දෙව් පියාණන් ගැන ජනතාවට කියා දුන්නා.

දුප්පත්, අසරණ අයට ඔවුන් වහන්සේ උදවු කළා. රෝගීන් සුව කළා. ඒත් එද සිටි ජුද නායකයා ජේසුස් වහන්සේ සැබෑ දේව පුත්‍රයා කියා පිළිගත්තේ නැහැ.

මගේ රත්තරන් දුවේ, පුතේ ඒ අය මට බොහෝ වේදනා දුන්නා. බොරු වැරදි කියා මහා බර කුරුසයක් කරට දුන්නා. කල්වාරි කන්ද නගින්න කිව්වා. ඒ ගමනේ දී කිහිප වරක් කුරුසයත් සමග මම වැටුණා.




කුරුසයේ එල්ලී හිඳ මරණයට පත් වුණ වෙලාවේ දැනුණ වේදනාව ඔයාලා වෙනුවෙන් දරා ගත්තා. මට වේදනා දුන්නු හැමෝට ම මම කමාව දුන්නා.

මගේ මරණින් දින තුනකට පසු ඉතා ජයග්‍රාහී ලෙස මරණය පරදා උත්ථාන වුණා.



මේ සියල්ල කළේ ඔබට දේව රාජ්‍යය ලබා දෙන්නයි. ඉතින් මා ඔබට ප්‍රේම කළාක් මෙන් ඔබත් එකිනෙකාට ප්‍රේම කරන්න. මගේ පුංචි දුවේ, පුතේ.

මෙයට
ඔබේ ආදරණීය
ජේසුස් වහන්සේ

**ආදර ජේසු සමිඳුනි, මා වෙනුවෙන් ඔබ වහන්සේගේ ජීවිතය පූජා කළාට ස්තූතියි. අද සිට මම ඔබ වහන්සේට තවත් ආදරේ වෙමි. කිසිවෙකුගේ සිත් නොරිදවා හැම දෙනාට ම කරුණාවෙන් උදවු කරන්නට මට පිහිට වුව මැනව. ආමෙන්!**



පැවැරුම

1. උත්ථාන වූ ජේසුස් වහන්සේ චිත්‍රයට නගා ඊට යටින් "ජේසුනි, මා සමග නතර වුව මැනව" කියා ලියන්න.

උපදෙස් :. 5 පාඩමට අදාළ ක්‍රියාකාරකම පිටු අංක 47හි ඇත.

# 6

# කීකරුයි අපි කීකරුයි



සීයා :

දුවේ, පුංචි ජේසු කුමරුට අවුරුදු දෙළොහක් වූ විට ජුසේ තුමා හා මරිය තුමිය සමග පාස්කු මංගල්‍ය සැමරීමට ජෙරුසෙලමේ දේව මාලිගාවට ගියා.

ඔවුන් ආපසු එන විට ජේසුස් වහන්සේ ඔවුන් සමග නැති බව දන ගොඩක් දුක් වුණා. දින තුනකට පසු දේව මාලිගාවේ පඬිවරුන් මැද සිට හමු වුණා. ජේසුස් වන්සේ දෙමවුපියන්ට කීකරු ව නැවත නාසරෙත් නුවරට පැමිණියා. (ශු. ලූක් 2 : 51.52)

## නිවසේ දී



අම්මා : දුව, මේ වතුර වීදුරුව සීයාට ගිහින් දෙන්න.

දුව : හොඳයි අම්මා. සීයාට වතුර ටික දීලා ජේසුස් වහන්සේ ගැන තව කතා ටිකක් අහගන්නම්.




පාසලේ දී

**ගුරුතුමිය:** මම අඳින්න කියපු චිත්‍රය දුවලා, පුතාලා ඇඳගෙන ආවා ද?

**පවන් :** ඔව් ටීචර්, චිත්‍රයත් ඇන්දා. ගීතිකාවත් පාඩම් කළා.

**ගුරුතුමිය:** ගුරුවරුන් දෙන වැඩ කීකරු ව හොඳටත් පිළිවෙළටත් කරන අයට දෙවි පියා හරි ම ආදරෙයි.

ආදර ජේසුස් වහන්ස, ඔබ වහන්සේ දේව පුත්‍රයා වුණත් ආඩම්බර වුණේ නෑ. මගේ ගුරුවරුන්ට, දෙමාපියන්ට කීකරු වී හොඳ ළමයෙක් වන්නට මට පිහිට වුව මැනව. ආමෙන්!



පැවරුම

1. අප කීකරු විය යුතු අය හතර දෙනෙකු නම් කරන්න.

7

# සතුටින් අපි උදවු කරමු



ගුරුතුමිය : මෙවර අපි සිංහල දමිළ අලුත් අවුරුද්ද සමරන්නේ ළමා නිවාසයකයි.

ළමයි : ළමා නිවාසය! ඒ මොකක් ද ටීචර්?

ගුරුතුමිය : ඔයාලා වගේ ම ළමයි තමා එහෙ ඉන්නෙත්. ඒත් ඒ අයට දෙමවුපියෝ නැහැ. පවුලක් නැහැ. ඒ වගේ අයට උදවු කරන්න ඕනෑ.

ළමයි : අපි කැමතියි! අපි කැමතියි. අපි ඒ අයට තෑගිත් දෙමු.

ගුරුතුමිය : ළමා නිවාසවල, වැඩිහිටි නිවාසවල තනි වී සිටින, රෝගී වී සිටින අයට උදවු කළ විට දෙවි පියාණන් වහන්සේ සතුටු වෙනවා.

### ළමා අපෙන්

ළමා අපෙන් ඔබට පිදෙන
යාගය සමිඳේ පිළිගන්න
මල් පලතුරු නැහැ දැල්වූ පහන් නැහැ
නොකිලිටි අපේ සිත් පිළිගන්න
අසරණයන් තුළ ඔබ හඳුනාගෙන
අප කළ යහපත පිළිගන්න
නිරතුරු ඔබගේ කැඩපත් වෙමු සමිඳේ//

අලුත් ම පැන්සල දෙකකට කඩා ලියන්න දුන්නේ
අඟලක පැන්සල මෙතෙක් ලියූ ඇය විසි කෙරුවේ
සතුටු සිනහවකි ඉම්හිරියාවකි පහල වුණේ
ඔබවයි සමිඳුනි මා දුටුවේ ඇයගෙ මුවේ



පැවරුම

1. ඔබ පන්ති කාමරයේ දී යහළුවන්ට උදවු වන අවස්ථාවක් නම් කරන්න. අඳින්න. පාට කරන්න.

8

# කිතුනු දරුවා හොඳ ළමයෙකි

දුවලා පුතාල දන්නවා ද ජේසුස් වහන්සේ ඔයාලගේ වයසේ දී තම සුරකි පියාගේ වඩු වැඩවලට උදවු වුණා. මරිය තුමියටත් කීකරු වී ගෙදර වැඩට උදවු කළා.

**අපිත් පුංචි ජේසු සමිඳු වගේ වෙමු.**

ගුරුවරුන්ට කීකරු වී හොඳින් ඉගෙන ගනිමු.

යහළුවන් සමග පන්තිය පිරිසිදු කරමු.

අසරණ අයට උදවු කරමු.

එකමුතු වී වැඩ කරමු.

දෙවිඳු යදිමු.



## පුංචි රහසක්

පුංචි රහසක් කියන්නයි හදන්නේ
ඔන්න ජේසු අහන් ඉන්න ඕනේ
පුංචි යැදුමක් කියා පුංචි ගීයක් ගයා
මටත් ජේසු වගේ වෙන්න ඕනේ//
පුංචි රහසක් කියන්නයි හදන්නේ....

ආයෙත් මං කවදාවත් බොරුවක් නම් කියන්නේ නැහැ
ආයෙත් මං කවදාවත් හොරකම් නම් කරන්නේ නැහැ
නිතර කීකරු වෙලා ඉන්න පැතුමක් කළා
මටත් ජේසු වගේ වෙන්න ඕනේ

ආයෙත් මං කවදාවත් කලහා නම් කරන්නේ නැහැ
ආයෙත් මං කවදාවත් නපුරුකම් කරන්නේ නැහැ
ජේසු හිටියා වගේ මමත් ඉන්නම් හොඳින්
මටත් ජේසු වගේ වෙන්න ඕනේ



පැවරුම

1. කිතුනු දරුවකු තුළ තිබිය යුතු හොඳ ගුණාංග තුනක් නම් කරන්න.

9

# මහෝත්තම දෙවි පියාණන් වහන්සේ නමදිමු





**දුව :** අම්මේ, අද අපි පල්ලි ගිහින් දෙවි පියා නමදින්නේ කොහොම ද කියලා ඉගෙන ගත්තා.

**අම්මා :** ඉතිං අපටත් කියන්නකෝ ඒ කොහොම ද කියලා.



**දුව :** පල්ලියට ඇතුළු වූ විට දෑත් එකතුකොට වැඳලා දණ නමස්කාර කරන්න ඕනෑ.

දොහොත් මුදුන් දී වඳින්න ඕනෑ කියලත් ගුරුතුමිය කියලා දුන්නා.



**ආදර දෙවි පියාණෙනි, ඔබ වහන්සේ මට ගොඩක් ආදරෙයි. මගේ ජීවිතය, අත්, පා, ඇස්, කන්, නාසය, බුද්ධිය සහ බොහෝ හැකියා ලබා දුන්නා. ඒ හැම දේ වෙනුවෙන් මම ඔබ වහන්සේට සැම දා වැඳ නමස්කාර කරමි. ආමෙන්!**

## සුදු පිරුවට ඇඳ

සුදු පිරුවට ඇඳ ඉටිපහනක් ගෙන
කොහේ ද පිය මැන යන්නේ
සන්සුන් ගමනින් සුදු මල් පොකුරක්
අරගෙන මොක ද කරන්නේ
නැගණිය කොහේ ද යන්නේ

ඉරිදා දෙවි සමිඳුන් නමදින්නයි
බැතියෙන් පිය ඔසවන්නේ
හද තුළ මතුවන බැතිය පුදන්නයි
දෙවි මැදුරට අපි යන්නේ
රුවින් මලින් පුද දෙන්නේ



පැවරුම

1. දෙවි මැදුරට ගොස් යාච්ඤා කරන ආකාරය ඔබේ හොඳ වැඩ පොතේ ඇඳ පාට කරන්න.
2. දේවස්ථානයට ඇතුළු වන විට තනි දණින් නමස්කාර කරන ආකාරය ක්‍රියාකාරී ව පන්ති කාමරය තුළ පුරුදු පුහුණු කරන්න.

# 10

# සාන්ත මරියනි



මරියතුමිය හැම දා ම දෙවි පියාට කතා කළා. දවසක් ගාබ්‍රියෙල් නම් දේවදූතයෙක් ඇවිත් ජේසුස් වහන්සේගේ මව වීමට මරියතුමිය තෝරා ගෙන ඇති බව පැවසුවා. මරියතුමිය බයවුණා. එහෙත් එතුමිය ඉතා ම බැහැපත්, කීකරු කෙනෙක් නිසා දෙවි පියාගේ කැමැත්තට හිස නැමුවා. (ශු. ලූක් 1 : 26.31)




දේව දූතයා තවත් සුභ පණිවුඩයක් ඇයට කිවුවා. ඇගේ නෑදෑ සොයුරියක් වූ එළිසෙබෙත් තුමියට දරුවෙක් නැතිව දුකින් සිටියා. ඒත් දෙවිපියා ඔවුන්ටත් දරුවෙක් දෙන බව කිවුවා. එය දැනගත් මරිය තුමිය ඇයට උදවු කිරීමට ගියා. ඇයගේ ආශීර්වාදය ද එතුමියට ලැබුණා. (ශු. ලූක් 1 : 39.45)



මරිය තුමිය කුඩා දරුවන්ට හරි ම ආදරෙයි. ඒ නිසා පාතිමා නුවර ලුසි, ජසින්තා සහ ෆ්‍රැන්සිස් යන පුංචි ළමයින්ට දර්ශනය වුණා.

ආදර දෙවි පියාණෙනි, මරිය තුමිය, ඔබ වහන්සේ
අපට ලබා දුන් උතුම් තිළිණයකි. එතුමිය අපේ අම්මා
ලෙස ආදරයෙන් බාර ගන්නට අප සැමට පිහිට වන්න.
එතුමිය වගේ බැහැපත්, යහපත්, කීකරු, පිරිසිදු ළමයින්
වන්නට අපට මග පෙන්වුව මැනව. ආමෙන්!



පැවරුම

1. මරියතුමියගේ ජීවිතයෙන් අපට ලබා ගත හැකි ගුණාංග දෙකක් ලියන්න.
2. මරියතුමියට කියන ගීතිකාවක් ලියන්න.

උපදෙස් :. 10 පාඩමට අදාළ ක්‍රියාකාරකම පිටු අංක 48හි ඇත.

# 11

# එකමුතු පවුල අපේ



අම්මා : පුතා, දුව දැන් හවස් වෙලා. මුහුණ කට සෝදා ගෙන එන්න. දැන් අපි යාච්ඤා කරන වෙලාවනේ.

පුතා : තාත්තේ, ඇයි අපි හැම දා ම එකතු වෙලා යාච්ඤා කරන්නේ?

තාත්තා: පුතා, අපි තනි ව යාච්ඤා කරනවා වගේ ම පවුලක් ලෙස යාච්ඤා කිරීමත් කළ යුතු ම දෙයක්.

දුව : ඒ ඇයි තාත්තේ?

තාත්තා: පුතාත්, දුවත් මටයි අම්මාටයි දුන්නේ දෙවි පියා. එකට යච්ඤා කරන පවුල එකට සිටිනවා. දෙවියන් වහන්සේ ඔවුන් මැද වැඩ සිටිනවා. ඒ නිසා තමයි අපි සතුටින් එකට ජීවත් වෙන්නේ.

**ආදර දෙවි පියාණෙනි, මගේ පවුල ගැන මම සතුටු වෙමි. අපේ පවුල ආශීර්වාද කර සියලු නපුරෙන් අප රැක ගත මැනව. ආමෙන්!**



පැවරුම

1. පවුලේ සැම එකතු වී යාච්ඤා කරන අවස්ථාවක් චිත්‍රයට නගන්න.

## ක්‍රියාකාරකම

★ ඔබ දිනපතා දෙවි පියාණන් වහන්සේ වෙත ළං වීමට කළ යුතු දේ පමණක් තෝරා පාට කරන්න.






# 12

# යමු අපි දෙවිඳුන් හමුවට

මහෝත්තම දෙවි පියාණන් වහන්සේ වැඩ වසන නිවස තමයි දෙවි මැදුර. එතුමාණෝ ඔබ එනතුරු ආශාවෙන් මග බලා සිටිනවා.



ඔබට මොන තරම් අඩුපාඩු තිබුණත් ඔබ මොන තරම් දුර්වල වුණත් මේ කිසිවක් දේව තාත්තා හොයන්නේ නෑ. අපි හැමෝ ම වාඩි වෙන්නේ එක ම බංකුවේ. යාච්ඤා කරන්නේ එක ම හඬින්. දේව මන්දිරය තුළ අපි හැමෝ ම දෙවි පියාගේ දරුවෝ.

අපි හැම උදය ම පිරිසිදු ඇඳුම් ඇඳ, සුදු මල් අරගෙන පිරිසිදු සිතින් දෙවිපියා බලන්න යමු.

පාසලේ දීත් පන්ති කාමරයේ දීත් අප සියලු දෙනා එකමුතු ව යාච්ඤා කරන්නට ඕනෑ. මිතුරු මිතුරියන් සමග ආදරයෙන් වැඩවල යෙදෙන්න ඕනෑ. මෙලෙස නිතර ම දෙවි පියා සතුටු කළ හැකි දේවල් කිරීමට උත්සාහ කරමු.

## නමෝ නමෝ

නමෝ නමෝ නමෝ වඳිමු
සමිඳු ගුරු සඳ
අදර බැති පෙමා
පුද හිස නමා
නමෝ නමෝ ...

මගේ සිත කය සැමකම
ඔබට අයිතිය
ඔබෙන් ලද දෙය ඔබට ම
දීම සුදුසු ය
නමෝ නමෝ ...



පැවරුම


1. ඔබ අයිති දේවස්ථානයේ නම ලියන්න.
2. දේවස්ථානයට ගොස් දෙවි පියා සමග කතා කරන ආකාරය ඇඳ පාට කරන්න.

උපදෙස් :. 12 පාඩමට අදාළ ක්‍රියාකාරකම පිටු අංක 49හි ඇත.

# 13

# සැමගෙ උදවු

මේ ඉන්නේ අපට උදවු කරන අයයි. ඒ අය අපට කරන උදවු මොනවා දැයි අපි කතා කරමු.



දිනපතා දෙවි පියා අපට මේ වගේ අයගෙන් උදවු ලබා දෙනවා.
අපි ඒ උදවු අගය කරන්න ඕනෑ.
ඔවුන් මතක් කර දෙවි පියාගෙන් ආසිරි පතන්න ඕනෑ.
ඔවුනට සිනහවෙන්, කරුණාවන්ත වචනයෙන් කළගුණ පෙන්වන්න ඕනෑ.

මේ අයට වගේ දෙවි පියා අපටත් අත් පා දී තිබෙනවා.
එම අත් සහ පාදවලින් දවස පුරා අප වැඩ කරනවා.
අත්වලින් දෙවිඳු වඳිනවා.
අනෙක් අයට උදවු කරනවා.
ඒ වගේ හොඳ වැඩ කරන විට අපට සතුට ලැබෙනවා.

ඒත් සමහරු අන් අයට උදවු කරන්න කැමති නැහැ.
තමා කැමති අයට විතරක් උදවු කරන අයත් ඉන්නවා.
සමහරු වැඩ කරන්න කම්මැලියි.
අනුන්ට හිංසා කරනවා.
දෙවි පියා ඒ අය ගැන දුක් වෙනවා.
ඒ නිසා දෙවි පියාණන් වහන්සේ මට දී ඇති අත් පාවලින් මම හොඳ වැඩ කරමි.

## සිසිල් සුළං රැලි පාවෙන්නේ

සතුටු සිනාවෙන් - මුව සරසාලා
සුහද කතාවෙන් - සිත් සනසාලා
දවස හොඳින් ගත කරන්න
සැමට ම සුබ සෙත සදන්න
අපට සරණ වන්න දෙවිඳුනේ//

සැමට දයාවෙන් - අතහිත දීලා
මෙත් කරුණාවෙන් - සැනසෙන ලීලා
නිරතුරු අප කල් ගෙවන්න
රට දියුණුව ඇති කරන්න
අපට සරණ වන්න දෙවිඳුනේ//



### පැවරුම

1. පාඩමට අනුව අපට සහාය වන අයගේ නම් හතරක් ලියන්න.
2. අපට සහාය වන අය ලබා දුන් දෙවි පියාට ස්තුති කර කෙටි යාච්ඤාවක් ලියන්න.

## 14

# ඔවදන් දෙයි - යහමග පෙන්වයි



අද අපේ පල්ලියේ ළමා දිව්‍ය පූජාවක් පවත්වනු ලැබුවා. පියතුමා පුංචි අපට ගොඩක් හොඳ දේවල් කියලා දුන්නා. ඒවා අහලා මගේ වැරදි හද ගන්න මම සිතට ගත්තා. පියතුමන්ලා අපට ගොඩක් ආදරෙයි.



දහම් පාසලේ උගන්වන සහෝදරතුමා "බාලයන්ට මා වෙතට එන්න ඉඩ දෙන්නැ"යි කියා පැවසූ ජේසුස් වහන්සේ ගැන ඉගැන්වූ දේවල් නම් මට කිසි දවසක අමතක වෙන්නේ නැහැ.



පාසලේ අපට ආගම උගන්වන කන්‍යා සොහොයුරියත් හරි ම හොඳයි. පොඩි පොඩි කතන්දර කියා දෙනවා. අපට අවවාද කර යහමග යවනවා.

අපේ ගුරුතුමියත් අපට කතන්දර කියලා දෙනවා. ප්‍රශ්න අහන විට මම උත්තර දෙන්නේ හරි ම සතුටින්.

**ආදර දෙවි පියාණෙනි, අපට යහමග යන්නට උදවු කරන සියලු දෙනා ම ආශීර්වාද කළ මැනව. ඔවුන්ට නීරෝගී සුවය දුන මැනව. ආමෙන්!**



පැවරුම

1. ඔබට යහමග යන්නට උදවු කරන දෙදෙනෙකු ඇඳ නම් කරන්න.

## 15

# ගව ඔරුවේ උපන් බිලිඳු



බෙත්ලෙහෙම් නුවරට එදා හරි ම උතුම් දවසක්. අහස පුරා තරු පිරිලා. අමුතු වල්ගා තරුවකුත් පායලා.

සුර දූතයන්ගේ ගීත හඬින් එඬේරු අවදි වෙලා.

මේ සීතල රෑ පුංචි ම පුංචි බිලිඳු හඬක් ඇතින් ඇසෙනවා.

මමත් ගියා ඒ පුංචි හඬ ඇහෙන පැත්තට. සොයාගෙන යන විට අමුතු තරුව නැවතිලා. එතැන හරි ම ලස්සනයි. එතැන ගවමඩුවක්. මම දැක්කා ලස්සන අම්මෙකුයි තාත්තෙකුයි හරි ම ලස්සන බබෙක් නළවනවා. මටත්

ඕනෑ වුණා ඒ බබා ළඟට යන්න. මම අඩිය ඉස්සරහට තබන විට ම මාව වැටුණා. දනුයි මට තේරුණේ මොක ද වුණේ කියලා. ඒත් මට හරි ම සතුටුයි. මම හීනෙන් හරි ජේසු කුමරු ළඟට ගියානේ.

ජේසුස් වහන්සේ බලන්න දුප්පත් එඬේරුන් තමයි මුලින් ම ආවේ. පස්සේ රජවරුන් තිදෙනෙක් ආවා කියලා මං අහල තියෙනවා. (ශු. ලූක් 2 : 3.20)

ඒත් අපි වගේ දුප්පත්, අසරණ අයට ජේසුස් වහන්සේ ගොඩක් ආදරෙයි කියලා අම්මා මට නිතර ම තේරුම් කරලා දෙනවා.

**ආදර ජේසු සමිඳුනි, ඔබ වහන්සේ වගේ, හැමෝට ම එකවගේ ආදරය කරන්න මට පිහිට වුව මැනව. මගේ යහළුවන් පමණක් තෝරා නොගෙන සැම දෙනා සමග සතුටින් ඉන්නට මට උදවු කළ මැනව. ආමෙන්!**




පැවරුම

1. නත්තලේ දී ඔබේ යහළුවාට යැවීමට අපතේ යන දේවලින් සුබ පැතුම් පතක් සාදන්න.
2. වචන ගළපා නිවැරදි වාක්‍ය ලියන්න.
   - i. ඉපදුණේ/ ජේසුස් වහන්සේ/ ගව මඩුවේ
   - ii. පායා/ වල්ගා තරුවක්/ අහසේ/ තිබුණා
   - iii. උදා වන්නේ/ දෙසැම්බර්/ නත්තල/ විසිපස්වෙනි ද

16

# පුංචි අපේ හොඳ මිතුරා

ගලීලයේ නාසරෙත් ගමේ
සුරැකි පියා මරි මවු සෙවණේ
කීකරු ජේසු පුතා වැඩුණේ
ශුද්ධ වූ පවුලක් ලෙස මෙලොවේ



ගෙදර දොරේ වැඩපළ බලලා
මරිමව් වෙත සෙනෙහස පාලා
පුංචි ජේසු කළ පුංචි ක්‍රියා
දෙව් පියහට පැසසුම් වූවා

වඩු මඩුවේ තම සුරැකි පියා
සාදන ලී බඩු දෙස බලලා
වෙහෙස නිවන අදහසින් පුතා
වතුර ගෙනාවා ප්‍රීතියෙනා

මව්පිය සමගින් ජේසු පුතා
දුක් කරදර ඉවසුමෙන් දරා
දෙවිඳුන් යදිමින් අන් අය උදෙසා
හැදී වැඩුණා දෙව් මහිමෙ පතා

ආදර දෙව් පියාණෙනි, ජේසුස් වහන්සේ වගේ අපටත් දෙමවුපියන්ට, වැඩිහිටියන්ට කීකරු වීමට පිහිට වුව මැනව. ආමෙන්!




### පැවරුම

1. ජේසුස් වහන්සේ වඩු මඩුවේ දී ජුසේ තුමාට උදවු වූ අවස්ථාවක් අඳින්න. පාට කරන්න.
2. ගෙදර වැඩවල දී ඔබ මවට හෝ පියාට උදවු වන අවස්ථාවක් ලියන්න.


### ක්‍රියාකාරකම

දෙමවුපියන්ට කීකරු විය හැකි අවස්ථා ඇති මල් පෙති කහ පාටින් පාට කරමු.



17

# ආදම් සහ ඒව




අප තමා දෙවි පියාණන්ගේ උතුම් ම මැවිල්ල. ඒ නිසා දුවලා, පුතාලා අපට ආදි මවුපියන් කියා කියනවා.

දෙවි පියාණන් අපට ගොඩක් ආදරේ කළා. නිතර ම අප සමග කතා කළා. අපට "ඒදන්" කියල ලස්සන උයනක් දුන්නා. (උත්පත්ති 1 : 27 , 2 : 8)

ඒ උයනෙ හැම ජාතියක ම රස පලතුරු තිබුණා. හැම ජාතියක ම සතුන් සමගියෙන් වාසය කළා. ඒ හැම දේ බලා ගන්න දෙවිපියා අපට කිවුවා. අපි ඒ සැම දෙයට ම නම් තැබුවා. අපි හරි ම සතුටින් ඒදන් උයනේ ජීවත් වුණා.



**පැවරුම**

1. පහත සඳහන් වචන යොදා හිස්තැන් පුරවන්න.

(ආදම් සහ ඒව, ඒදන්, පලතුරු, ආදරය, කීකරු)

i. දෙවියන් වහන්සේ මැවූ ආදි මවුපියන් වන්නේ ...................... ය.

ii. ආදම් පදිංචි කරන ලද්දේ .................. උයනේ ය.

iii. ඒදන් උයනේ තිබූ ........................ හරි ම රසවත් ය.

iv. අපි සතුන්ට ....................... කරමු.

v. දෙවි පියාට අපි ...................... වෙමු.

18

# කායින් සහ ආබෙල්

කායින්



ආබෙල්




ආදම් සහ ඒවට කායින් සහ ආබෙල් කියලා පුතුන් දෙදෙනෙක් සිටියා. (උත්පත්ති 4 : 2ආ . 5)

| | |
|---|---|
| • කායින් ගොවියෙකි. | • ආබෙල් එඬේරෙකි. |
| • කායින්ගේ සිතුවිලි අයහපත්. | • ආබෙල්ගේ සිතුවිලි යහපත්. |
| • දෙවි පියාට ආදරය කළේ නැහැ. | • දෙවි පියාට ආදරය කළා. |
| • දෙවි පියාට පූජා කළේ අලුත් ම අස්වැන්න නොවේ. | • දෙවි පියාට පූජා කළේ අලුත උපන් බැටළු පැටියා. |
| • කායින්ගේ පඬුර ගැන දෙවි පියා දුක් විය. | • ආබෙල්ගේ පඬුර ගැන දෙවි පියා සතුටු විය. |

ආදර දෙවි පියාණෙනි, සෑම විට ම ඔබ වහන්සේට ඇති ආදරය නිසා මා කරන පුංචි වැඩක් වුණත් හොඳින් කර ඔබ වහන්සේ සතුටු කිරීමට මට පිහිට වුව මැනව. ආමෙන්!

## ක්‍රියාකාරකම

- ★ තාරදියේ ඇති පඬුරුවලින් දෙවි පියාණන් වහන්සේට ප්‍රසන්න වූ පඬුර තෝරා පාට කරන්න.



# 19


# නෝවා සහ ජලගැල්ම



**අම්මා :** වහිනවා වහිනවා ඉවරයක් නෑ. එළියටවත් බහින්න බෑ. නෝවාගේ කාලයේ සිදුවුණ ජලගැල්ම වගේ.


**පුතා :** මොකක් ද අම්මේ ඒ සිදුවීම?

**අම්මා :** පුතේ, දෙවි පියාණන් වහන්සේ මිනිසුන්ට ගොඩක් ආදරය කළා. ඒ වුණාට මිනිසුන් නපුරු ක්‍රියා කළා. ඒ ගැන දෙවි පියා කනගාටු වුණා. එම හේතුව නිසා ඔවුන්ට දඬුවමක් ලැබුණා.



දෙවි පියාට ඉතා ආදරයෙන් කීකරු ව සිටි කෙනෙක් තමයි නෝවා. කිසි ම දවසක නපුරු වැඩ කළේ නැහැ. එම නිසා දෙවි පියාගේ අනුකම්පාව නෝවාට ලැබුණා. දඬුවමින් නෝවා බේර ගන්න සිතූ දෙවි පියා නෝවාට කතා කරලා ලොකු ජලගැල්මක් එවන බව පැවසුවා.

නෝවා ඒ බව කියා ජනතාවට අවවාද කළා. ඒත් ඒ අය තම නරක වැඩ අත හැරියේ නෑ. දෙවි පියාගෙ හඬට කීකරු වූ නෝවා තම පුතුන් සමග එකතු වී විශාල නැවක් හැදුවා. නැව සාදා නිම කරන්න අවුරුදු දෙකක් පමණ කල් ගියා.



දෙවි පියාණන් පැවසූ ලෙසට ම ඔහුගේ පවුලේ සියලු දෙනාත් හැම වර්ගයකට ම අයත් සතුන්ගෙන් ජෝඩුව බැගිනුත් නැවට ඇතුළු කර ගත්තා. දෙවිපියා නැවේ දොර වසා දැමුවා. වැස්ස පටන් ගත්තා.


පුතා : දවස් කීයක් වැස්ස ද අම්මේ?

අම්මා : දවස් හතළිහක් ම නොනවත්වා වැස්සා. ලොකු ගංවතුරකින් ලෝකය ම විනාශ වුණා. නැවේ සිටි අය පමණක් බේරුණා. වැස්ස නතර වෙලා ජලය බැස ගියා.

නෝවා සහ නැවේ සිටිය සියලු දෙනා ම නැවෙන් එළියට පැමිණියා. නෝවා දෙවි පියාට තුති පිදුවා. සියල්ලෝ ම දෙවි අණට කීකරු වෙමින් අලුත් ජීවිතයක් ගත කළා. ඒ නිසා දෙවිපියා අපට අනුකම්පා කර ආදරයේ සලකුණක් දුන්නා.

පුතා : ඒ මොකක්ද අම්මේ?

අම්මා : ඒ තමයි අහසේ පායන ලස්සන දේදුන්න.
(උත්පත්ති 7 : 1.24, 8.9)



පැවරුම

1. විශාල නැවක් සෑදුවේ කවුද?
2. නැව සෑදීමට අවුරුදු කීයක් ගත වුණා ද?
3. වැස්ස පැවති දින ගණන කොපමණ ද?
4. දේව ආදරයේ සලකුණ අඳින්න. පාට කරන්න.

උපදෙස් :. 19 පාඩමට අදාළ ක්‍රියාකාරකම පිටු අංක 50හි ඇත.

# 20

# ශුද්ධ වූ දොමිනික් සාවියෝ මුනිතුමා



- ශුද්ධ වූ දොමිනික් සාවියෝ මුනිතුමාගේ උපන් දිනය 1842 අප්‍රේල් මස 02 වන දිනයි.
- මෙතුමා ඉපදුණේ ඉතාලිය නම් රටේ.
- සාවියෝ මුනිතුමා මහත් භක්තියකින් දිව්‍ය පූජාවට සහභාගි වූ දරුවෙකි.
- ජේසුස් වහන්සේ සමග කතා කිරීමට විශේෂ ආශාවක් දැක්වූවා.
- තද සීත කාලයේ පවා උදේ ම අවදි වී දේවස්ථානයට ගියා.

- පියතුමාට සහාය වුණා.
- මෙතුමාගේ මංගල්‍යය මාර්තු 10වන දින සමරනු ලැබේ.

**ආදර දෙවි පියාණෙනි, ශුද්ධ වූ දොමිනික් සාවියෝ මුනිතුමා මෙන් ඔබ වහන්සේට ආදරය කරන්න මට පිහිට ලබා දෙන්න. හැකි සෑම විට ම එතුමා වගේ දෙව්මැදුරට යාමට මා තුළත් ආශාවක් ඇති කළ මැනව. ආමෙන්!**



පැවරුම

1. මෙහි ඇති වචන අතුරින් "දොමිනික් සාවියෝ මුනිතුමාගේ මංගල්‍යය මාර්තු දහවන දිනයි" යන වැකියට අදාළ වචන පමණක් රවුම් කරන්න.

ඉතාලියේ දොමිනි ක් ඉ පදුණු ස ාවියෝව ගේ

මුනිතුමාගේ අප හොඳ මංගල්‍යය ළමයි මාර්තු වෙන්න

දහවන ඕනෑ දිනයි මෙහෙමයි.

21

# ශුද්ධ වූ නිකුලස් මුනිතුමා



- සාන්ත නිකුලස් මුනිතුමා ඉපදුණේ තුර්කිය නම් රටේ.
- මෙතුමා ඉතා ධනවත් පවුලක එක ම දරුවා විය.
- කුඩා කල සිට ම එතුමා දෙවි පියාට දැඩි ආදරයක් දැක්වූ සාන්තුවරයෙකි.
- ශුද්ධ වූ නිකුලස් මුනිතුමා තමාගේ මුදල් හා ඇඳුම් වැනි සියලු වස්තුව දුප්පතුන් අතර බෙදා දුන්නා. ඒවා රහසින් ඒ අයගේ දොර ළඟ තබා ගියා.
- නත්තල් කාලයේ නත්තල් සීයා රහසින් අපට තෑගි තබා යන්නේ නිකුලස් මුනි ආදර්ශය අනුවයි.

ඔබත් දුප්පත් ළමයෙකුට රහසින් උදවු කර නත්තල් සීයෙක් වෙන්න කැමති ද?

**ආදර දෙවි පියාණෙනි, ශුද්ධ වූ නිකුලස් මුනිතුමා මෙන් නැති බැරි අය සමග බෙදා ගැනීමට අපට පිහිට වුව මැනව. ආමෙන්!**




පැවරුම

1. සාන්ත නිකුලස් මුනිතුමා මෙන් ඔබත් මේ නත්තලේ දී දිළිඳු අයට දීමට කැමති තෑගි දෙකක් ලියන්න. අඳින්න. පාට කරන්න.

උපදෙස් :. 21 පාඩමට අදාළ ක්‍රියාකාරකම පිටු අංක 51හි ඇත.


## ක්‍රියාකාරකම - 1 පාඩම

★ මහෝත්තම දෙවි පියා ලබා දුන් දේවල් ආරක්ෂා කර ගැනීම සඳහා තැබිය යුතු නිසි තැන සොයා යා කරන්න.



## ක්‍රියාකාරකම - 5 පාඩම

කුරුසය බර වුණේ මගේ වැරදි නිසා. ඒ වෙනුවට කළ යුතු හොඳ දේවල් තිත් ඉරි මත ලියමු.




1 කීකරුකම

2 හොඳ වචන කීම

3 මවුපියන්ට ආදරය කිරීම

## ක්‍රියාකාරකම - 10 පාඩම

★ මෙහි ඇති ජපමාලය පාට කරන්න.

ස්වර්ගයයේ වැඩ සිටින - රතු

නමෝ මරිය - නිල්




## ක්‍රියාකාරකම - 12 පාඩම

ඔබ දේවස්ථානයට යන නිවැරදි පාර සොයා කැමති පාටකින් පාට කරන්න.



## ක්‍රියාකාරකම - 19 පාඩම


★ ඉලක්කම් යා කරන්න. සෑදෙන රූපය නම් කරන්න. එම රූපය තුළ නෝවා ගෙන ගිය සතුන්ගෙන් තුන්දෙනෙක් අඳින්න.



## ක්‍රියාකාරකම - 21 පාඩම

මෙහි සිටින නත්තල් සීයාගේ ඇඳුම එහි ලියා ඇති පාට සව්කඩදාසි කැබලිවලින් කුඩා බෝල සකස් කර, අලවා අලංකාර කරමු.

රතු - 1
කළු - 2
සුදු - 3




## ක්‍රියාකාරකම - 2 පාඩම


දෙවි පියාගේ ආදරය නිසා ඔබට ලැබුණු තෑගි වල පින්තූර කොටුව වටේ කපා අදාළ රවුම තුළ අලවන්න.


අහස


පොළොව


ජලය














පිටු අංක 31, 42, හා 44 හි අඩංගු චිත්‍ර අන්තර්ජාලය ඇසුරින් ලබා ගන්නා ලදී.